මගේ අංක සීජී/1/1/8විවිධ
ආයතන අංශය
මිනින්දෝරු දෙපාර්තමේන්තුව
කොළඹ-05

17 FEB 2022

2022.02.10 දින

දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරින්ගේ දැන ගැනීම සඳහා,

**2022 වර්ෂයේ ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීම**

2022 වර්ෂයේ වැය විෂයන්ට අදාළව ඉතා සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් කාර්තුමය වශයෙන් අනුමත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

02. ඒ අනුව ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2/8/11/01-IV හා 2022.02.03 දිනැති ලිපියෙන් ලබා දී ඇති උපදෙස් පරිදි අතිකාල ගෙවීම් කළමනාකරණය කර ගැනීමටත්, ඉන්ධන වියදම්, ප්‍රවාහන නඩත්තු වියදම් හා ගමන් වියදම් කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු බව ද දන්වමි.

03. එබැවින් අත්‍යාවශ්‍ය රාජකාරි පමණක් හඳුනා ගනිමින් ඒවා සඳහා පමණක් වාහන යෙදවීමටත්, මාණ්ඩලික නිලධාරින් කාණ්ඩායම් ප්‍රවාහනයේදී උපරිම පිරිසක් කණ්ඩායම් ගත කර ප්‍රවාහන පහසුකම් ලබා දීමටත් වග බලා ගන්නා ලෙස සහ පවතින සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය උපරිම ලෙස කළමනාකරණය කර ගැනීම ඔබගේ වගකීමක් ලෙස සළකා කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

ඩී. අනුරාධා එල්. ඉලේපෙරුම,
අතිරේක සර්වේයර් ජනරාල්,
(මානව සම්පත් හා පාලන)
සර්වේයර් ජනරාල් වෙනුවට.

ඩී. අනුරාධා එල්. ඉලේපෙරුම
අතිරේක සර්වේයර් ජනරාල් (මානව සම්පත් හා පාලන)
සර්වේයර් ජනරාල් කාර්යාලය
අංක 150, බර්නාඩ් සොයිසා මාවත, (කිරුළ පාර)
නාරාහේන්පිට, කොළඹ 05.